# පුරප්පාඩු සඳහා ඉල්ලුම්පත් කැඳවීම

## ජාතික පොලිස් කොමිෂන් සභාව

ජාතික පොලිස් කොමිෂන් සභාව මගින් කළමනාකරණ සේවා නිලධාරී සේවයේ පවතින පුරප්පාඩු සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති විශ්‍රාමික නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

I. කළමනාකරණ සේවා නිලධාරී සේවයේ III, II හෝ I ශ්‍රේණියේ විශ්‍රාමික නිලධාරියෙකු විය යුතුය.

II. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 67 නොඉක්මවා තිබිය යුතුය.

III. බඳවාගනු ලබන නිලධාරීන්ට මහජන පැමිණිලි විමර්ශන රාජකාරි පැවරෙන බැවින් විමර්ශන කටයුතු පිළිබඳව පළපුරුද්දක් ලබා තිබීම අනිවාර්යය වේ.

IV. සිංහල භාෂාව හැරුණුවිට වෙනත් භාෂා හැකියාව අමතර සුදුසුකමක් වේ.

V. අයදුම්කරුවන් කිසිදු දඬුවමකට හෝ විනයානුකූල ක්‍රියාමාර්ගයකට යටත් කරනු ලැබූ අයෙකු නොවිය යුතුය.

VI. තනතුරට නියමිත වරප්‍රසාදවලට අමතරව ඒකාබද්ධ වැටුපෙන් 25% ක දිරි දීමනාවක් ගෙවනු ලැබේ.

02. අපේක්ෂිත අයදුම්කරුවන් තම ජීවදත්ත තොරතුරු ඇතුළත් අයදුම්පත් 2021 නොවැම්බර් මස 15 දිනට පෙර **ලේකම් ජාතික පොලිස් කොමිෂන් සභාව, අංක** 09 ගොඩතැගිල්ල, BMICH යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, අයදුම්පත් එවනු ලබන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවර තමන් ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

**එම්. සමන්ති මිහිඳුකුල**
**ලේකම්,**
**ජාතික පොලිස් කොමිෂන් සභාව.**